ජනාධිපති කාර්යාලය
ஜனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය -: පීඑස්/සීඑස්ඒ/00/1/4/12

2025 ජනවාරි මස 21 වන දින

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත,**

**නව රජයේ අමාත්‍යවරුන්ගේ කාර්යයන් සහ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා පහසුකම් සැලසීම සඳහා වන උපදෙස්**

පැවති ජනාධිපතිවරණයේ දී හා පාර්ලිමේන්තු මහ මැතිවරණයේ දී ජනතාව විසින් වත්මන් රජය වෙත බලය ලබා දීමේ දී අපේක්ෂා කරන ලද කරුණු සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමු කරවීමට කැමැත්තෙමි. එහි දී, මහජනතාව විසින් ආර්ථික සංවර්ධනය, නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීම, රජය තුළ සිදු වන වංචා, දූෂණ හා අක්‍රමිකතා අවම කර යහපත් රාජ්‍ය පාලනයක් ස්ථාපනය කිරීම, රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීම, ආර්ථිකය ඇතුළු සියලුම ක්ෂේත්‍ර තුළ සමානාත්මතාව සහ සමාජ සාධාරණත්වය තහවුරු කිරීම, දරුවන් හා තරුණ පරපුර වෙනුවෙන් සුරක්ෂිත අනාගතයක් ගොඩ නැංවීම මෙන්ම පුරවැසියන්ගේ ජීවිත නිදහස්ව හා සාමකාමීව පවත්වා ගෙන යාම ආදී කරුණු රැසක් සැලකිල්ලට ලක් කර ඇති බව පෙනේ.

02. වත්මන් රජයේ ප්‍රතිපත්තිය වන 'පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය මහජනතාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව, මෙම ප්‍රතිපත්ති ප්‍රකාශයේ අඩංගු කරුණු ක්‍රියාකාරී සැලැස්මක් තුළින් ජනතාව වෙත රැගෙන යාම රාජ්‍ය සේවයේ කාර්යය හා වගකීම බවට පත් වේ.

03. තව ද, මෙම මැතිවරණයේ දී ප්‍රකාශයට පත් කළ ජනතා අභිලාෂය තුළ මෙතෙක් රටේ සංවර්ධනයට සම්බන්ධ කර නොගත් විශාල පිරිසක් එම කාර්යයන් සඳහා සක්‍රියව සම්බන්ධ කර ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කර ඇත. එසේ ස්වෙච්ඡාවෙන් තමාගේ දැනුම හා කුසලතාව රටේ සංවර්ධනය වෙනුවෙන් ලබා දීමට ඉදිරිපත්ව සිටින බුද්ධිමතුන්, වෘත්තීයවේදීන් සහ අත්දැකීම් සහිත පුරවැසියන්ගේ සහය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ලබා ගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපනය කළ යුතුය. ආණ්ඩුකරණයේ ව්‍යුහයන් තුළට එම පිරිස සම්බන්ධ කර ගැනීමත්, එමඟින් ජනතාව අපේක්ෂා කරන ලද සංවර්ධනය වඩා වේගවත් කර ගැනීමේ අරමුණ සඳහා පහසුකම් සැලසීම සිදුකළ යුතුය. ඒ සඳහා ගරු අමාත්‍යවරුන්ගේ සහාය කාර්ය මණ්ඩලයට දැනුම, කුසලතා සහ ඉහළ පළපුරුද්දක් සහිත පිරිසක් පත් කර ගැනීම අත්‍යවශ්‍ය වන අතර, එමඟින් අපේක්ෂිත ප්‍රතිඵල වඩාත් හොඳින් ළඟා කර ගත හැකි යැයි අපේක්ෂා කළ හැකිය.

## 1. අමාත්‍යාංශ සඳහා උපදේශකවරු පත් කර ගැනීම

### 1. 1. ස්වෙච්ඡා උපදේශකවරුන් පත්කර ගැනීම

සෑම අමාත්‍යවරයකුටම ස්වකීය අමාත්‍යාංශයේ කාර්යය හා කර්තව්‍යයන් සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සහය වීම පිණිස උපදේශකවරයෙක් හෝ කණ්ඩායමක් පත් කර ගත හැකි වේ. එම පිරිස සඳහා පහසුකම් සැලසීමට පහත උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.

1.1.1 මෙම උපදේශකවරුන් ලෙස පත් වන පිරිස අදාළ අමාත්‍යාංශයේ විෂයය පථය සම්බන්ධයෙන් ප්‍රාමාණික උගතුන්/ පර්යේෂකයන්/ වෘත්තීයවේදීන්/ පුරවැසි සංවිධාන නියෝජිතයින් හෝ මහජන නියෝජිතයින් විය යුතුය.

ගාලු මුවදොර, කොළඹ 01.
காலி முகத்திடல், கொழும்பு 01.
Galle Face, Colombo 01.
දුරකථන / தொலைபேசி / Telephones: +94 (0) 11 2354418, +94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: +94 (0) 11 2446657
ඊ - තැපැල / மின்னஞ்சல் / E-mail: prsec@presidentsoffice.lk

1.1.2 උපදේශක මණ්ඩලය සඳහා පත් කිරීමේ බලය විෂය භාර අමාත්‍යවරයා සතු වන අතර එම පත් කිරීම් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සටහනක් මගින් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කළ යුතුය.

## 1.2. අමාත්‍යාංශ සඳහා පූර්ණ කාලීන උපදේශකවරයන් පත් කර ගැනීම

1.2.1. අමාත්‍යාංශයේ විෂය කටයුතු සම්බන්ධයෙන් දැනට සිටින කාර්ය මණ්ඩලයට අමතරව විශේෂඥ විෂය දැනුම තවදුරටත් එම අමාත්‍යාංශයට ලබා ගත යුතු යැයි අමාත්‍යවරයාට හැඟී යන්නේ නම්, එහි දී ඒ සඳහා විෂය ප්‍රවීණතාව අනුව උපදේශකවරයෙක් හෝ උපදේශකවරුන්ගේ සේවය, ගෙවීමේ පදනමින් හා පූර්ණ කාලීනව සේවය කිරීමේ පදනමින් ලබා ගැනීමට අවස්ථාව ඇත.

1.2.2. කිසියම් අමාත්‍යාංශයක් විෂය ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කරන අවස්ථාවල දී එකී එක් එක් විෂය ක්ෂේත්‍රයන් සඳහා බඳවා ගත හැකි අතර, එහි උපරිම සංඛ්‍යාව දෙදෙනෙකු නො ඉක්මවිය යුතුය.

1.2.3. මෙම උපදේශකවරුන් සඳහා ලබා දෙන දීමනා සහ පහසුකම් අදාළ උපදේශකවරයාගේ අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද මත තීරණය කළ යුතු අතර, එය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි (සංශෝධන ද ඇතුළත්ව) SL3 තනතුරුවල වැටුප්, දීමනා සහ අනෙකුත් පහසුකම් මට්ටම ඉක්මවා නොයා යුතුය.

1.2.4. එම උපදේශකවරයා/වරුන් සඳහා ප්‍රවාහන පහසුකම් හා දීමනා උක්ත තනතුරට අනුරූපීව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 (සංශෝධන ද ඇතුළත්ව) ට අනුව සලසා දිය යුතුය.

1.2.5. උපදේශකවරයන් පත් කිරීම අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත සිදු කළ යුතු වේ.

## 2. අමාත්‍යවරුන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සහාය කාර්යය මණ්ඩලය

2.1. අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන් සිය කාර්යයන් වඩා කාර්යක්ෂමව සහ සියලු පාර්ශවයන් සමඟ මනා සම්බන්ධීකරණයෙන් යුතුව පවත්වා ගෙන යාම සඳහා සහාය කාර්ය මණ්ඩලයක් පත් කර ගත යුතුය. එම කාර්යාල වල සේවා නියුක්තිය පහත සඳහන් උපරිම සංඛ්‍යාව නො ඉක්මවිය යුතුය.

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | අමාත්‍යවරුන් සඳහා | නියෝජ්‍ය අමාත්‍යවරුන් සඳහා |
| 1. | පෞද්ගලික ලේකම් | 01 | 01 |
| 2. | සම්බන්ධීකරණ ලේකම් | 02 | 02 |
| 3. | මාධ්‍ය ලේකම් | 01 | 01 |
| 4. | මහජන සම්බන්ධතා නිලධාරී | 01 | 01 |
| 5. | පුද්ගලික සහකාර | 01 | 00 |
| 6. | කළමනාකරණ සහකාර | 05 | 03 |
| 7. | කාර්යාල කාර්ය සහායක | 02 | 02 |
| 8. | රියදුරු | 02 | 02 |
| | **එකතුව** | **15** | **12** |

2.2. පෞද්ගලික ලේකම්, සම්බන්ධීකරණ ලේකම්, මාධ්‍ය ලේකම් සහ මහජන සම්බන්ධතා නිලධාරි යන නිලධාරීන් අමාත්‍යවරයා / නියෝජ්‍ය අමාත්‍යවරයා ධූරය දරන කාලයට පමණක් සීමා වන පරිදි තාවකාලික පදනම මත සේවයේ යොදවා ගත යුතුය.

2.3. මෙම තනතුරු සඳහා අමාත්‍යවරයාගේ / නියෝජ්‍ය අමාත්‍යවරයාගේ පවුලේ සාමාජිකයින් හෝ සමීප ඥාතීන් පත් නොකර ගත යුතුය.

2.4. ඉහත 2.1 ඡේදයේ අංක 1 සිට 4 දක්වා වන තනතුරු වල කාර්යය මණ්ඩලය සඳහා වන වැටුප් 2016/02/25 දිනැති හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 උපලේඛනය IV පරිදි විය යුතුය.

2.5. රාජ්‍ය වියදම් අවම කිරීමත්, මේ වන විටත් සේවයේ නියුක්තව සිටින රාජ්‍ය සේවයේ මානව සම්පත හැකිතාක් දුරකට ඵලදායීව සේවයේ යොදවා ගැනීමත් සලකා බලා ඉහත 2.1 ඡේදයේ අංක 5 සිට 8 දක්වා වන තනතුරු සඳහා කාර්ය මණ්ඩලය හැකි තාක් දුරට රාජ්‍ය සේවයේ නියුතු පිරිස අතරින්ම තෝරා ගත යුතුය.

2.6. උක්ත තනතුරු සඳහා රාජ්‍ය සේවයේ නිලධාරීන් අනුයුක්ත කර ගන්නේ නම් ඔහුට / ඇයට ගෙවිය යුතු වන්නේ රාජ්‍ය සේවයේ නිත්‍ය තනතුරේ වැටුප හෝ තනතුරට අදාළ වැටුප යන දෙකෙන් වැඩි අගය සහිත වැටුප විය යුතුය. එසේම මෙම අනුයුක්ත කිරීම හේතුවෙන් ඔහුගේ / ඇයගේ නිත්‍ය සේවාවේ ජ්‍යෙෂ්ඨත්වයට බලපෑමක් නොවිය යුත්තේය.

2.7. තව ද, මෙම කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණ රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලවලින් අනුයුක්ත කර ගත හැකිය. එම ආයතන වනුයේ 2016.04.16 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 හි සංශෝධිත ඇමුණුම 01 යටතේ දක්වා ඇති ලැයිස්තුවේ අන්තර්ගත ආයතන වේ. ඔවුන්ගේ වැටුප් පරිමාණයන් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 (සංශෝධන ද ඇතුළත්ව) ට අනුව සකස් විය යුතුය.

2.8. කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණ රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලය අනුයුක්ත කර ගන්නේ නම් ඔහුට / ඇයට ගෙවිය යුතු වන්නේ නිත්‍ය තනතුරේ වැටුප හෝ තනතුරට අදාළ වැටුප යන දෙකෙන් වැඩි අගය සහිත වැටුප විය යුතුය. එසේම මෙම අනුයුක්ත කිරීම හේතුවෙන් ඔහුගේ / ඇයගේ නිත්‍ය සේවාවේ ජ්‍යෙෂ්ඨත්වයට බලපෑමක් නොවිය යුත්තේ ය.

2.9. ඉල්ලීම පරිදි එම කාර්ය මණ්ඩලය කඩිනමින් නිදහස් කර යැවීමට සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් / දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

2.10. කෙසේ වෙතත්, රාජ්‍ය සේවයේ සේවක පුරප්පාඩු හේතුවෙන් ඉහත කාර්යය මණ්ඩලයට අනියම් හෝ කොන්ත්‍රාත් පදනමින් බඳවා ගනු ලබන්නේ නම් ඔහු / ඇය තනතුරට අදාළ රජයේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ සුදුසුකම් සපුරා තිබිය යුතුය. එම කාර්ය මණ්ඩලයේ සේවා කාලය ද අදාළ අමාත්‍යවරයා / නියෝජ්‍ය අමාත්‍යවරයා ධූරය දරන කාලයට පමණක් සීමා විය යුතුය.

2.11. අතිකාල දීමනා සඳහා හිමිකම් ලබන රියදුරන් ඇතුළු කාර්ය මණ්ඩලය සඳහා මාසික අතිකාල දීමනා ලැබිය හැකි වන්නේ පැය 180ක උපරිමයට යටත්ව වන අතර, ඔවුන්ට මාසිකව උපරිම දින 12 ක සීමාවක් සඳහා සංයුක්ත දීමනා ලැබීමට හිමිකම් ලැබිය හැකිය. කෙසේ වෙතත් මෙම දීමනාවන් සඳහා පෞද්ගලික ලේකම්වරයාගේ නිර්දේශයෙන්, අමාත්‍යාංශ ලේකම් වෙතින් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

## 3. වාහන සහ ඉන්ධන

3.1. අමාත්‍යවරුන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පරිහරණය සඳහා වෙන් කරන නිල වාහන සංඛ්‍යාව උපරිම වශයෙන් දෙකක් (02) වේ.

3.2. අමාත්‍යවරයකුගේ හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුගේ හෝ පරිහරණය සඳහා රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක හෝ රාජ්‍ය සමාගමක වාහන යොදා ගන්නේ නම්

හෝ බාහිරින් කුලී පදනම මත ලබා ගන්නේ නම්, ඒ සම්බන්ධයෙන් වන වගකීම අමාත්‍යාංශ ලේකම්වරයා විසින් දැරිය යුතුය. බාහිරින් කුලී පදනම මත ලබා ගැනීමේ දී එම වියදම් අනුමත ප්‍රතිපාදන සීමාවන් තුළ පවතින බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී ලෙස අමාත්‍යාංශ ලේකම්වරයා වග බලා ගත යුතුය.

3.3. අමාත්‍යවරුන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ නිල වාහනය / වාහන වෙනුවෙන් එක් මාසයක් සඳහා උපරිම වශයෙන් ඉන්ධන ලීටර 900ක් සඳහා ප්‍රතිපාදන වෙන් කෙරේ.

3.4. ඉහත 2.1ඡේදයේ දක්වා ඇති අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සහාය කාර්ය මණ්ඩලයේ අංක 01 සිට 04 දක්වා නිලධාරීන් එක් නිල වාහනයක් සඳහා පමණක් හිමිකම් ලබයි. ඔවුන්ගේ වාහන සඳහා ඉන්ධන 2021.12.29 දිනැති හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/2010 (I) අනුව ලබා දීමට කටයුතු කළ යුතුය.

## 4. දුරකථන

4.1. අමාත්‍යවරයෙකු / නියෝජ්‍ය අමාත්‍යවරයෙකු වෙත සපයනු ලබන උපරිම නිල රාජකාරි දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව පහත පරිදි වේ.

| දුරකථන | | | |
|---|---|---|---|
| කාර්යාල | නිවාස | ජංගම | කාර්යාල ෆැක්ස් |
| 02 | 01 | 01 | 01 |

4.2. අමාත්‍යවරයකුගේ / නියෝජ්‍ය අමාත්‍යවරයකුගේ සහාය කාර්ය මණ්ඩලය සඳහා සපයනු ලබන උපරිම නිල රාජකාරි දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව පහත පරිදි වේ.

| | දුරකථන | | |
|---|---|---|---|
| | කාර්යාල | ජංගම | කාර්යාල ෆැක්ස් |
| පෞද්ගලික ලේකම් | 01 | 01 | 01 |
| සම්බන්ධීකරණ ලේකම් | 01 | 01 | - |
| මාධ්‍ය ලේකම් | 01 | 01 | 01 |
| මහජන සම්බන්ධතා නිලධාරී | 01 | 01 | - |

4.3. අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ දුරකථන වියදම්වල (මාසික ස්ථාවර ගාස්තුව හා බදු මුදල් හැර) මුළු එකතුව සඳහා වන උපරිම සීමා පහත පරිදි වේ. ඔවුන් සඳහා, අනුමත නිවාස, කාර්යාල, ජංගම දුරකථන හා ෆැක්ස් සඳහා වන දුරකථන වියදම් ද ජාත්‍යන්තර දුරකථන ගාස්තු වේ නම් එම ගාස්තු ද මෙම සීමාව තුළ දැරිය යුතුය.

| | උපරිම සීමාව (රුපියල්) |
|---|---|
| කාර්යාල සහ නිවාස දුරකථන සඳහා | 20,000.00 |
| ජංගම දුරකථනය සඳහා | 10,000.00 |

4.4. අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සහාය කාර්ය මණ්ඩලයේ දුරකථන වියදම් වල (මාසික ස්ථාවර ගාස්තුව හා බදු මුදල් හැර) මුළු එකතුව සඳහා වන උපරිම සීමා පහත පරිදි වේ. ඔවුන් සඳහා අනුමත නිවාස, කාර්යාල, ජංගම දුරකථන හා ෆැක්ස් සඳහා වන දුරකථන

වියදම් ද ජාත්‍යන්තර දුරකථන ඇමතුම් ගාස්තු වේ නම්, එම ගාස්තු ද මෙම සීමාව තුළ දැරිය යුතුය.

| තනතුර | උපරිම සීමාව (රුපියල්) |
|---|---|
| පෞද්ගලික ලේකම් | 6,000.00 |
| සම්බන්ධීකරණ ලේකම් | 5,000.00 |
| මාධ්‍ය ලේකම් | 5,000.00 |
| මහජන සම්බන්ධතා නිලධාරී | 5,000.00 |

4.5. අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සහය කාර්ය මණ්ඩලය සඳහා රජයේ වියදමින් ජංගම දුරකථන හා උපකරණ ලබා නොදිය යුතුය.

4.6. ඉහත සඳහන් කර ඇති උපරිම සීමාව අනුව, යම් මාසයක් තුළ මුදලින් ඉතිරියක් වේ නම්, එම ප්‍රමාණය එම මුදල් වර්ෂයෙහිම වෙනත් මාසයක වැඩිපුර දරා ඇති දුරකථන වියදම් සඳහා හිලව් කළ හැකිය.

4.7. මෙම චක්‍රලේඛය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පරිදි නිකුත් කරන ලද අතර අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් සඳහා උපදේශකවරුන් බඳවා ගැනීම සහ ඔවුන් වෙනුවෙන් දීමනා ලබා දීම පිළිබඳව වූ අමප/17/1980/753/009 සහ 2017.09.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ සහ අමාත්‍යවරුන් සඳහා උපදේශකවරුන් පත් කිරීම පිළිබඳව වූ අංක අමප අංක 20/1399/301/006 පිළිබඳව වූ 2020.09.21 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණයේ විධිවිධාන තවදුරටත් අදාළ නොවනු ඇත.

4.8. මේ සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර තිබූ 2024 අප්‍රේල් 05 දිනැති හා පීඑස්/සීඑස්ඒ/00/1/4/12, 2023 ජූනි 21 දිනැති හා පීඑස්/සීඑස්ඒ/00/1/4/12, 2022 සැප්තැම්බර් 12 දිනැති හා පීඑස්/සීඑස්ඒ/00/1/4/12, 2022 සැප්තැම්බර් 09 දිනැති හා පීඑස්/සීඑස්ඒ/00/1/4/12, 2022 සැප්තැම්බර් 09 දිනැති හා පීඑස්/සීඑස්ඒ/00/1/4/1, 2019 දෙසැම්බර් 02 දිනැති හා පීඑස්/සීඑස්ඒ/00/1/4/1, 2015 පෙබරවාරි 11 දිනැති හා සීඑස්ඒ/1/17/1/1, 2010 මැයි 14 දිනැති හා සීඒ/1/17/1 යන විධිවිධාන අවලංගු වන බව වැඩිදුරටත් දන්වමි.

4.9. ඉහත විධිවිධාන මෙම අමාත්‍ය මණ්ඩල තීරණයට එළැඹි 2025.01.06 දින සිට බලාත්මක වේ.

ඉහත සීමාවන්ට යටත්ව අමාත්‍යවරුන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්යාල, අමාත්‍යාංශ උපදේශක මණ්ඩල, සහ අමාත්‍යවරුන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සහය කාර්ය මණ්ඩල කඩිනමින් ස්ථාපිත කොට රජයේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට ඔබගේ සහයෝගය අපේක්ෂා කරන බව කාරුණිකව දන්වමි.

ආචාර්ය එන්.එස්. කුමානායක
ජනාධිපති ලේකම්

පිටපත් :-

1. අග්‍රාමාත්‍ය ලේකම්
2. අමාත්‍ය මණ්ඩල ලේකම්
3. ලේකම්, මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
4. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
5. විගණකාධිපති